**අක්කරෙයිපත්තු ප්‍රාදේශීය සභාව**
**අම්පාර දිස්ත්‍රික්කය**
**-------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**
**------------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**------------------------------------**

2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 අප්‍රේල් 06 දිනද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 31 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, 2016 වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 ඔක්තෝබර් 12 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**
**-----------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට අක්කරෙයිපත්තු ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
**--------------------------------------**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**
**-----------------------**

පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය විසින් 2015 වර්ෂයේදී සභාවට ලබාදෙනු ලැබූ රු.715,713 ක් වටිනා ජල බවුසරය ගිණුම්වලට ගෙන නොතිබුණි.

**2. මූල්‍ය සමාලෝචනය**
**----------------------**

**2.1 මූල්‍ය ප්‍රතිඵලය**
**------------------**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලය රු.1,603,549 ක පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායමක් විය. එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.3,930,177 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු. 2,326,628 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි.

**2.2 ආදායම් පරිපාලනය**
**---------------------**

**2.2.1 වරිපනම් හා බදු**
**-------------------**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තිය ප්‍රකාර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් ව්‍යාපාරික ස්ථාන 368 ක් සහ නිවාස 4,673 ක් මත 2010 වර්ෂයේ සිට වරිපනම් තක්සේරු කර අයකර ගැනීමට කටයුතු කර නොතිබීමෙන් වාර්ෂිකව ආසන්න වශයෙන් රු.2,520,500 ක ආදායමක් අහිමි වී තිබුණි.

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

**3.1** **කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) සභාවට අයත් ට්‍රැක්ටරය සහ එහි ට්‍රේලරය ද මෝටර් වාහන පනතේ 203 වන අධිකාරයේ 2(i) වගන්තියෙහි සඳහන් විධිවිධාන ප්‍රකාර මෝටර් රථ දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි නොකර භාවිතා කරමින් පැවතුණි.

(ආ) ජල නළ සම්බන්ධ කිරීම වෙනුවෙන් එක් කොන්ත්‍රාත්කරුවෙකුට සමාලෝචිත වර්ෂයේදී ගෙවනු ලැබූ රු.130,310 ක එකතු කළ අගය මත බදු පිළිබඳ විස්තර 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.12 මාර්ගෝපදේශය ප්‍රකාර සභාව විසින් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයාට දැනුම් දී නොතිබුණි.

(ඇ) පර්චස් 502.4 ක වපසරියක පිහිටා ඇති සභාවේ කාර්යාලය, පුස්තකාල, පොදු වෙළඳපොළ සහ ක්‍රීඩා පිටිය ආදී ඉඩම් 06 ක අයිතිය මාරු කරගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) සභාව සතු වාහන සඳහා වන ආදායම් බලපත්‍ර නියමිත කාලසීමාව තුළ ලබාගැනීමට නොහැකි වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දඩ ගාස්තු ලෙස රු.11,600 ක් ගෙවා තිබුණි.

(ඉ) සභාවේ JCB යන්ත්‍රය සමාලෝචිත වර්ෂයේ අනතුරකට ලක්වීමෙන් රු.115,128 ක් වියදම් කර අලුත්වැඩියා කර තිබුණත්, මෙම අනතුර සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 (1) ප්‍රකාරව පොලීසියට පැමිණිලි කිරීම සහ පරීක්ෂණයක් සිදු කොට අලාභය ගණනය කර එයට වගකිව යුත්තන් තීරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) සභාව සතුව භාවිතා කළ හැකි තත්ත්වයේ වාහන 14 ක් පැවතියද එම වාහන සඳහා රියදුරන් 04 දෙනෙකු පමණක් අනුයුක්ත කර තිබීම හේතුවෙන් එම වාහනවලින් උපරිම ප්‍රයෝජන ගත නොහැකි තත්ත්වයේ පැවතුණි.

(උ) ජල සම්බන්ධතාවය ලබාගැනීම වෙනුවෙන් අක්කරෙයිපත්තු ජල සම්පත් හා ජලාපවාහන මණ්ඩලයට සමාලෝචිත වර්ෂයේදී සියයට 11 ක එකතු කළ අගය මත බදු වෙනුවට සියයට 15 ක එකතු කළ අගය මත බදු මුදල් ගෙවා තිබීම හේතුවෙන් කොන්ත්‍රාත්කරුට රු.34,749 ක මුදලක් වැඩියෙන් ගෙවා තිබුණි.

**3.2** **කොන්ත්‍රාත් පරිපාලනය**

**3.2.1** **ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ දේශීය වැඩසටහන**

ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ දේශීය වැඩසටහන යටතේ 2016 සැප්තැම්බර් 29 දින පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය විසින් වැඩසටහන් 18 ක් අනුමත කර රු.3,850,000 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණි. එසේ වුවත්, මලාපවාහන පද්ධති අලුත්වැඩියා සහ මහජන පුස්තකාල අලුත්වැඩියා සඳහා වෙන්කරනු ලැබූ රු.410,000 ක මුදල් අදාළ කාර්යය සඳහා භාවිතා කර නොතිබුණි.

**4.** **ගිණුම්කටයුතුභාවය හා යහපාලනය**

-----------------------------------------

**4.1** **නිරවුල් නොකළ විගණන ඡේද**

-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අක්කරෙයිපත්තු ප්‍රාදේශීය සභාව 2011 වර්ෂයේ සිට, මහ නගර සභාවක් හා ප්‍රාදේශීය සභාවක් වශයෙන් කළමනාකරණ ඒකක දෙකක් ලෙස වෙන්කිරීමේදී නිසි අනුමැතියකින් තොරව මුළු එකතුව රු.25,808,155 ක් වටිනා වත්කම් සහ මුළු එකතුව රු.2,398,775 ක් වටිනා වගකීම් ගිණුම්වලින් ඉවත් කර තිබුණි.

(ආ) 2015 වර්ෂයේ ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන යටතේ අභ්‍යන්තර මාර්ග පුනරුත්ථාපනය කිරීමේ කටයුතු සඳහා සභාවේ මෝටර් ග්‍රේඩරය (Motor Grader) භාවිතා කර තිබූ නමුත් එම මෝටර් ග්‍රේඩරය මඟින් සිදුකළ කාර්යයන් සඳහා වන රු.42,000 ක ගාස්තු අදාළ කාර්යය සඳහා ගිවිසුම්ගත ප්‍රජාපාදක සංවිධානයට ගෙවා තිබුණි.

**5.** **පද්ධති හා පාලන**

--------------------

පහත දැක්වෙන පාලන ක්ෂේත්‍රය හා ඒ ඉදිරියේ දක්වා ඇති කරුණු කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කළ යුතුව ඇත.

| | පාලන ක්ෂේත්‍රය | | විශේෂ අවධානය යොමුකළ යුතු කරුණු |
|---|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් පාලනය | (i) | ස්ථාවර වත්කම් ලේඛනය පවත්වා ගැනීම. |
| | | (ii) | නිෂ්කාර්යව පවතින වත්කම් ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කිරීම. |
| (ආ) | ඝන අපද්‍රව්‍ය කළමනාකරණය | | ඝන අපද්‍රව්‍ය වෙන්කර එකතු කිරීම. |